# කම්කරු අමාත්‍යාංශය

# ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

## තනතුරු පුරප්පාඩු

කම්කරු අමාත්‍යාංශයට අනුබද්ධිත හා 2010 අංක 12 දරණ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත යටතේ ස්ථාපිත ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ, ප්‍රකාශන හා ව්‍යාපෘති) : තනතුරු 01**
**සහකාර අධ්‍යක්ෂ (පාලන) : තනතුරු 01**

**සේවා ගණය** : කළමනාකාර

**වැටුප් කාණ්ඩය** : MM 1-1

**වැටුප් පරිමාණය** : රු. 53,175/- 10x1,375-15x1,910 - රු. 95,575/-
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02 / 2016 අනුව බඳවා ගැනීමේදී මුලික වැටුප රු. 53,175/-ක් වේ)

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන්**

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යා / ව්‍යාපාර පරිපාලන / කළමනාකරණය / කලා / නීති විෂයය ක්ෂේත්‍රයකින් මුලික උපාධියක් ලබා තිබීම

සහ

ii. උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ මාණ්ඩලික තනතුරක වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

i. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

සහ

ii. අදාළ තනතුරට පැවරෙන විෂය ක්ෂේත්‍රය අදාළ කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 5ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**බඳවා ගන්නා අකාරය :** විවෘත තරඟ විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**මූල්‍ය නිලධාරී : තනතුරු 01**
**වැඩසටහන් නිලධාරි : තනතුරු 01**

**සේවා ගණය** : කණිෂ්ඨ කළමනාකාර

**වැටුප් කාණ්ඩය** : JM 1-1

**වැටුප් පරිමාණය** : රු.42,600/ - 10x755-18x1,135 - රු. 70,580/-
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව බඳවා ගැනීමේදී මුලික වැටුප රු. 42,600/-ක් වේ)

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන්**

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම විෂය ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම *

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සදුසුකම්**

i. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම සහ
ii. අදාල විෂය ක්ෂේත්‍රයට අදාල තනතුරක "කළමනාකරණ සහකාර" සේවා ගණයේ II ශ්‍රේණියේ වසර 05ක පළපුරුද්ද

* මූල්‍ය නිලධාරී තනතුර සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාල ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබිය යුතුය

**බඳවා ගන්නා ආකාරය:** විවෘත තරඟ විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) : තනතුර 01

**සේවා ගණය** : කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)

**වැටුප් කාණ්ඩය** : MA 1-1

**වැටුප් පරිමාණය** : රු. 27,910 -10x300-7x350-4x495- 20x660 -රු. 48,540/-
(කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 අනුව බඳවා ගැනීමේදී මූලික වැටුප රු. 27,910/-ක් වේ)

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන්**

අධ්‍යාපන සුදුසුකම්

i. අධ්‍යනය පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ, ගණිතය, ඉංග්‍රිසි භාෂාව යන විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් 06කින් සමත්ව තිබීම, සහ
අධ්‍යනය පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේදී අවම වශයෙන් විෂයන් (03) ක් සමත්ව තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සදුසුකම්**

**ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන සහ ශිල්පීය සේවා ගණයන්හි පහත සඳහන් සුදුසුකම් ඇති සේවකයන්ට මේ සඳහා අයදුම් කළ හැක.**

i. අධ්‍යනය පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ, ගණිතය, ඉංග්‍රිසි භාෂාව යන විෂයන් ඇතුළුව විෂයන් 04ට සම්මාන සාමාර්ථය සහිතව එකවර විෂයන් 06කින් සමත්ව තිබීම, සහ
ii. සේවයේ ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය
iii. නියමිත දිනට පුර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙන් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය

**බඳවා ගන්නා ආකාරය:** විවෘත තරඟ විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වයස් සීමාව**

අයදුම්කරුවන් වයස අවු 22 ට නොඅඩු හා අවු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

**වෙනත් සුදුසුකම්**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය
iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය

**සේවා නියුක්ත කරවීමේ කොන්දේසි**

පත්වීම ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.

**අයදුම් කිරීමේ ක්‍රමය**

මෙම නිවේදනය අග යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද, ඉතිරිය අනෙක් පිටුවලටද වන ලෙස සකස් කළ අයදුම්පතක් සම්පූර්ණ කර අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සුදුසුකම් සනාථ කළ හැකි සහතික පිටපත් සමඟ අයදුම්පත් යොමු කළ යුතු වේ. තවද, දැනටමත් රජයේ සංස්ථා / මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන, නියමිත දිනට විභාග ගාස්තු ගෙවා නොමැති අයදුම්පත් හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු. 500.00කි. එම විභාග ගාස්තුව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය නමින් ලංකා බැංකුවේ නාරාහේන්පිට ශාඛාවේ අංක 0071451995 දරණ ගිණුමට බැර කර ඒ සඳහා නිකුත් කරන රිසිට්පතේ මුල්පිටපත අයදුම්පත්‍රයට නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ගෙවනු ලබන විභාග ගාස්තු කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. මෙම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාල තනතුර සඳහන් කර **2022.03.07** දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේ නම් එක තනතුරකට එක බැගින් වන සේ අයදුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතුවේ.අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසු ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

තරඟ විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් අසත්‍ය තොරතුරු සපයා ඇති බව හෝ අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

මෙම තනතුරු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය ජාතික ශ්‍රම අධ්‍යනය ආයතනයේ පාලක මණ්ඩලය සතු වේ.


දුරකථන අංකය - 0112 786541
ඊ - මේල් - nilsprocurementunit@gmail.com
වෙබ් අඩවිය - www.nils.gov.lk

**අධ්‍යක්ෂ ජනරාල්**
ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය
2 වන මහල
කම්කරු මහලේකම් කාර්යාලය
කොළඹ 05